# පුස්වැල්ලේ යල්ගොවිතැන් ප්‍රතිඵල.

# PADDY CULTIVATION AT PUSSELLA.

---

පහත අත්සන් කරණ මවිසින් 1929 යල් කන්නට ගොවිකම් දෙපාර්තමේන්තුවේ මහතුන්ගේ ගුරු හරුකම් ඇතුව තරඟ වසයෙන් අත්හදා බැලීමේ ගොවිතැනේ ප්‍රතිඵල මෙහි පහත දක්වමි.

පසුගිය ජූනි—අප්‍රේල්වල පළවූ ගොවිකම් සඟරාවේ නොම්මර 96වෙනි පිළෙ පළවුනු මාස් ගොවිතැන් ලිපියේ පෙනීයන කුඹුරු කොටස්වලින් බුසල් 15ක වපසරිය, කොටසක් බුසල බැගින් නොවස් වසයෙන් නියරවල් බැඳලා හී දෙක තුන හාලා නගුල්ගාලා සහ පෝරුගාලා මඩ කලල්කර මාස 5හේ මුදුකිරියල් වී තවන් සාර හෝ එම මුදුකිරියල් වී සහ මාස 4රේ හිනටි වී වපුරු වල් උදුරා නෙලීම ඇතුව හෝ නැතුව කිසි පෝරක් නොමැතිව සාමාන්‍ය අන්දමට ගොවිමහතුන්ගේ ප්‍රමාද දොසත් ඇතුව මැයි මාසේදී වපුරා සහ තවන්කළ පැළ සිටුවා වතුර නොමැතිකමින් මැරීයමින් සැප්තැම්බ්‍ර මස අගදී කපා පාගා රෙඩු බොල් හැර මැන බැලූවිට ඉතා සුළුප වශයෙන් මුළු කුඹුරෙන්ම බුසල් 214ක් සහ කාල් දෙකක්ද වී ලැබූබව කතගාටුවෙන් දැනුම්දෙමි.

අවට පළාත්වල වැඩිදෙනෙකුට මෙපමනවත් නැතුව බිත්තර වී ටිකවත් ලබාගැනීමට නුපුළුවන්ව ගොයන් මැරීගොස් කුඹුරු පාළුවිය. 1929යේ සහ 1930යේ මාස් කන්නට කැකුලමට සහ දැනට මඩට වැපිරීමට වතුර පුරවා බැඳගත ගොවිතැන් කටයුතුවල යෙදී සිටීමේ ප්‍රීතියද ප්‍රකාශකරමින් යල්ගොවිතැනේ ප්‍රතිඵලය පහත දක්වමි.

පිලියොන් විසින් කෝපි හේනේ කුඹුර කොටසක මුදුකිරියල් වී කාල් 5ක් අප්‍රේල්මස 10වෙනි දින තවන්කර මැයි මස අගපටන් ජූනි මුල දක්වා එම කුඹුරේ වී බුසල් 3ක වපසරියක පැළ සිටුවා වතුර නොමැතිව මැරීගොස් සැප්තැම්බ්‍ර මස කපා පාගා මැන බැලූවිට ලැබුණු ගණන බුසල් 8යි. කාර්තු 3යි.

පුංචිඅප්පුහාමි කිරිඅප්පුනයිදේ අබකුඹුරේ බුසල් 2ක වපසරි මුදුකිරියල් වපුරා වල් උදුරා නෙලා මැන බැලූවිට ලැබුණ ගණන බුසල් 60යි කාර්තු 3යි.

ඕංගිරි බන්ඩා අබකුඹුරේ බුසල් 2ක වපසරිය මුදුකිරියල් වපුරා නෙලා මැන බැලුවිට ලැබුණ ගණන බුසල් 49කි.

හීන්බන්ඩා රංකිරා කුරුන්ද කුඹුරේ වී බුසල් 2ක වපසරිය පමණක් නෙලා වපුරා කුඹුර පාළුවී ගොස් එයින් ලැබුණේ වී බුසල් 39ක් සහ කාර්තු 2කි.

මුදියන්සේ කලුබන්ඩා කුරුන්ද කුඹුරේ වී බුසල් 2ක පමණ වපසරිය නෙලන්නේ නැතුව පාලුවී ගොස් මුදුකිරියල් බුසල් 26ක් පමණ ලැබුණේය.

පුන්චි අප්පුහාමි කිරිඅප්පු නයිදේ කුරුන්ද කුඹුරේ වී බුසල් 1ක පමණ වප සරියේ ඉඩම වපුරා නෙලන්නේ නැතුව පාලුවී ගොස් ලැබුණේ බුසල් 12ක් සහ කාර්තු 2කි.

පුස්වැල්ලේ මුහන්දිරම්ලා කිරිඅප්පු නයිදේ කුරුන්ද කුඹුරේ වී බුසල් 1ක වපසරිය මුදුකිරියල් වපුරා නෙලන්නේ නැතුව ඔහුගේ ප්‍රමාද දෝෂයෙන් නරක්වී මැරීගොස් එයින් ලැබුණේ වී බුසල් 2ක් සහ කාර්තු 2කි.

කිරිබන්ඩා පුසුබා උඳුරුකබල කුඹුරේ හීනටි වී බුසල් දෙකක වපසරියේ වපුරා නෙලන්නේ නැතුව මැරීගොස් එයින් ලැබුණේ වී බුසල් 15ක් සහ කාර්තු 2කි.

තවද අවට කුඹුරුවලත් සවල්ප වශයෙන් වී ලැබුනි. කොයි කව්රුත් වැඩි දෙනෙකුගේ හිතුවක්කාරකම් නැතුව ප්‍රමාදනොවී අප්‍රේල් මාසේ මැද මුදුකිරියලුත් අගදී හීනටිවීත්, මැයි මුලදී තුන්මාසේ මඩඇල්, දහනලා යනාදිය වතුර බැඳ වල් නෙලා ගොවිතැන් කලානම් ගොයම් නොමැරී එයින් වැඩි අස්වැන්න ලබාගෙන මාස් කන්නට නිසිකලට මාවී කැකුලත් වපුරා වතුර බැඳගෙන ප්‍රීතියෙන් සිටීමට තිබුනබව ගොවි මහත්වරු වැඩිදෙනෙක් ප්‍රකාශකරමින් මතුවට යහ පාඩමක් ඉගනගත් බවයි.

මීට,

පුස්වැල්ලේ එක්සත් සමාගමේ ප්‍රධාන සභාපතිතැන්පත්

ඒ. බී. වී. ඇම්. කලුබණ්ඩා,

මාවතගම